# අහංකාර සරුංගලය



ජයලි තරුල්‍යා චන්ද්‍රසිරි

# අහංකාර සරුංගලය

ISBN 978-624-206-720-9

කෘතිය පළ කරන දිනය - 2023 . 11 .25

කතෘගේ වෙනත් කෘති - දඟකාර හා පුංචා

- ආදරණීය පූස් පැටියා

## පිදුම

නිරන්තරයෙන් ඇස ගැටෙන අහස ,සඳතරු, තුරුලතා, ඇළ දොළ , සතා සිව්පාවුන්, හා බැඳුණු සොබාදහමේ සරල සිදුවීම් දෙස මතුපිටින් නොපෙනෙන ගැඹුරු අරුතක් දකින්නට මා යොමුකරන ආදරණීය තාත්තාට,

ඉගෙනීමේ, පොතපතේ අගය කියාදෙමින් අධ්‍යාපනයෙන් දිවිය ජයගත් දියණියක් කරන්නට දිවා රෑ මා වෙනුවෙන් වෙහෙසෙන සෙනෙහෙබර අම්මාට,

පොතපතට, කලාවට, ක්‍රීඩාවට මා යොමුකරමින් ඒ තුළින් ලොවම ජයගත් මහමායාවියක් කරන්නට මා හට ගුරුහරුකම් ලබාදෙන නිති අපගැන සිතන සමන්මලී ගුරුමෑණියන්ටත්,

මාගේ දඟකාර මල්ලියාටත් මෙම පොත සෙනෙහසින් පුදමි.

# ස්තුතිය

මෙම පොත ලිවීමට නන් අයුරින් මා හට උදව් උපකාර කළ වදනකින් හෝ ශක්තියක් වූ, මා දිරමත් කළ සියලු දෙනාටම තුති පුදමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේම පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරනය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථ කරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛන අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සිව්ශේෂ ජයග්‍රහනයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් **''දිවිය දිනන විද්‍යුත් පොතක් ''** ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශය අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක් '' ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට, අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය , ගුරු භවතුන් , දෙමාපියන්, ආදිශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදවු උපකාර කළ සැමට හෘදයංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට පිවයක් වූ සෙනවිරත්න මහලේකම් මහතාගේ සේවය ද අගයමි.

**ශශිකලා සේනාධීර ,**
**විදුහල්පතිනිය,**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.**
**2023-10-20**

ඔන්න එක දවසක් උමාෂි එයාගේ මල්ලිත් එක්ක මිදුලේ බෝලයකින් සෙල්ලම් කරමින් හිටියා . බෝලය ටිකක් ඈතට ගිය නිසා මල්ලී බෝලය ගේන්න දුවගෙන ගියා. ඒ අතරේ සිලි සිලි සිලි හඬ නගමින් ටිකක් අමුතු ශබ්දයක් උමාෂිට ඇසුණා එයා මදක් විපරමින් අවට බැලුවා.

''අනේ ලස්සන සරුංගලයක් '' උමාෂිට ඉබේටම කියවුණා ''මල්ලී, මල්ලි, ඉක්මනට එන්න'' මල්ලී ඉක්මනින් ම දුවගෙන ආවා ''ඇයි අක්කේ'' ''මල්ලී අර බලන්න අපේ මී අඹ ගහේ ලස්සන සරුංගලයක් පැටලිලා '' ඒ වෙනකොටත් එයාගේ ලස්සන ඇඳුම ඉරිලා එයත් හරි අමාරුවෙන් කරකැවෙමින් තමයි හිටියේ.




‘‘අපි එයාට උදවු කරමු. විපතට පත්වුණු කෙනෙකුට උපකාර කරන එක හොඳ පුරුද්දක් කියලා ටීචර් අපිට කියල දීලා තියනවනෙ ’’ මල්ලී ඉක්මනින්ම ගෙදරට දුවලා ගිහින් තාත්තව එක්කගෙන ආවා. තාත්තා ගොඩක් අමාරුවෙන් ගහට නැගලා සරුංගලේට තවත් තුවාල නොවෙන්න පරිස්සමින් බිමට බස්සවා ගත්තා.


ඉහි ඉහි ඉහි සරුංගලය හොඳටම අඬනවා අපිටත් හරිම දුකයි අපි ඉක්මනින්ම ඔයාගේ තුවාල සනීප කරලා ඔයාට ලස්සන ඇඳුමක් අන්දවන්නම්.



‘‘ඔයාට කොහොමද මේ වගේ කරදරයක් වුණේ’’ තාත්තා සරුංගලයෙන් ඇසුවා. “ඉහි ඉහි ඉහි මම ඈත ගෙදරක පුංචි අයියා කෙනෙක් ලඟ හිටියේ එයා හැමදාම මාව වැව පාමුල  වෙල් යායට අරන් උඩ අහසට යවනවා , ඉතින් මඳ සුළගේ අහසේ පාවෙනකොට හරිම සතුටක් නිදහසක් දැනෙනවා පහළ තියන හැමදෙයක්ම හරිම ලස්සනට මට පේනවා. සමහර දවසට සරුංගල් නැන්දලා මාමලා මට කියනවා ගොඩක් උඩ පියාඹන්න එපා ඒක අනතුරු දායකයි කියලා. හැබැයි මගේ ලස්සන නිසා මම එයාලා කියන දේවල් සැලකුවේ නැහැ” .



ඉතින් මට ඕන වුණා තව තවත් ඉහළ අහසට ගිහින් ලස්සන බලන්න. මම නිතරම බැලුවේ කොහොමද මාව හිරකරගෙන ඉන්න නූලෙන් ගැලවෙන්නේ කියලා. එදා ටිකක් සුළඟ සැර දවසක් මට හිතුනා අද තමයි මට නිදහස ලබන්න තියන හොඳම දවස කියලා. මම පුලුවන් තරම් මගේ ශක්තිය යොදලා කරණම් ගහලා නූලෙන් ගැලවී නිදහස් වුණා. මම ඉහළ අහසට වේගයෙන් ගියා අනේ හරිම ලස්සනයි ඇළ දොළ කෙත් වතු ගංගා හරිම ලස්සනට පේනවා  සිනිදු වලාකුළු වල සීතල මට දැනෙන් ගත්තා.  මට තව තවත් දුරයන්න හිතුණා. හැබැයි ඒ සතුට වැඩි වෙලාවක්නම් තිබුනෙ නැහැ. ටික වෙලාවකින් සැඩ සුළඟක් සමග පොරබදින්න සිද්ධ වුණා. මට එතරම් ශක්තියක් නැහැ කියලා මට මොහොතකින් තේරුණා. මට මාව පාලනය කරගන්න බැරි තරම් වේගයෙන් දුර ඈතට පාවී ගියා. මට හරිම වෙහෙසයි, මහන්සියි. මම හයියෙන් කෑ ගැසුවත් උදවු කරන්න කවුරුත් හිටියෙ නැහැ. මම කොච්චර මෝඩ වැඩක් ද කළේ කියලා මට තේරුණා. අන්තිමේදී මම ඔහේ පාවී ඇවිත් මේ මී අඹ අත්තේ පැටලුනා.



සරුංගලය ඒ කතාව කියලා ඉවරවෙනකොට අපිට එයා ගැන ගොඩක් දුක හිතුණා.

"දැක්ක නේද පුතේ මේ සරුංගලය අපි හැමෝටම ලොකු කතාවක් කියලා දුන්නේ. අපිට රැකවරණය ආරක්ෂාව සලසන අයගේ උපදෙස් වලට අපි ගරු නොකර හිතුවක්කාර වුණොත් මේ වගේ අනතුරු, විපත් වලට ගොදුරු වෙන්න වෙනවා. මේක ජීවිතේ හැමදාටම හොඳම පාඩමක් කරගන්න".

තාත්තා කිව්වා.



<u>**පසු වදන**</u>



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීම සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්ව පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන්ට ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නවමාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගෙ` හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම් කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතිකතලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් හා පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

**"දිවිය දිනන විද්‍යුත් පොතක් "** ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරියක වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023/11/01